ರ. 5000.00

203053
2013.01.17

# ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ විග්‍රහය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනපති පරීක්ෂණය සඳහා බෞද්ධ

දර්ශනය විෂයය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

31 OCT 2011

Libary - USJP
203053

GS/MPhil/BP/3827/09

203053

## අපේක්ෂකයාගේ සහතිකය

මෙම ශාස්ත්‍රීය නිබන්ධය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමියන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ධනපාල විජේසිංහ මහාත්මාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ද ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

...................................

# උපදේශකවරුන්ගේ සහතිකය

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මෙම අපේක්ෂකයා විසින් 'ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ විග්‍රහය' නම් පර්යේෂණ මාතෘකාව යටතේ 2011. 10. 20 දින පශ්චාද් උපාධි පීඨයේ දී පවත්වන ලද වාචික පරීක්ෂණයෙන් පසුව පරීක්ෂකවරුන් විසින් පෙන්වා දී තිබූ සංශෝධනයන් සකස් කොට නියමිත පටිපාටියට අනුව ඉදිරිපත් කරන බවත්, ඒ සඳහා සුදුසු බවටත් නිර්දේශ කරමු.

..........................................

ආචාර්ය, පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

31.10.2011
..........................................
දිනය

..........................................

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.එම්. ධනපාල
සමාජ හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

31/10/2011
..........................................
දිනය

## අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණන්ගේ නිර්දේශය.

බෞද්ධ දර්ශනය විෂයය යටතේ දර්ශනපති උපාධිය සඳහා විභාග අංක GS/MPhil/BP/3827/09 යටතේ කුඩාකත්නෝරුවේ විනීත හිමියන් විසින්, ''ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ විග්‍රහය'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද ස්වාධීන පර්යේෂණ අධ්‍යයන නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරමි.

31.10.2011
.............................................

අධ්‍යයනාංශ ප්‍රධාන හිමිපාණෝ

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය

# පිදුම

හෙට ගලන හිරු එළිය

මගේ නොව නුඹේ මැ යි

කියා දී සෙනෙහසින්

ඒ හිරුට කළියෙන් ම

අවපසින් සැඟව ගිය

සදාදර පියතුමනි,

ඔබේ මතකය අසල

පුදන්නට අවසරයි.

* * * *

## කෙටි යෙදුම්

| | |
|---|---|
| අං.නි. | අංගුත්තර නිකාය |
| ඛු.නි. | ඛුද්දක නිකාය |
| දී.නි. | දීඝ නිකාය |
| බු.ජ.මු. | බුද්ධ ජයන්ති මුද්‍රණය |
| සං.නි. | සංයුත්ත නිකාය |
| සු.නි. | සුත්ත නිපාතය |

# අනුක්‍රමිකාව


| | | | පිටු අංක |
|---|---|---|---|
| අනුක්‍රමිකාව | | | i-ii |
| උපකාරානුස්මෘතිය | | | iii-iv |
| නිබන්ධ සාරාංශය | | | v-vi |
| 1. | පළමුවන පරිච්ඡේදය - හැඳින්වීම | | 1-16 |
| | 1.1 | පර්යේෂණ පසුබිම | 1-3 |
| | | 1.1.1 ආපදා නිවාරණයේ ඓතිහාසික පසුබිම | 3-10 |
| | | 1.1.2 ආපදා නිවාරණය පිළිබඳ නූතන අර්ථකථන | 10-13 |
| | 1.2 | පර්යේෂණ ගැටලුව හැඳින්වීම | 13-15 |
| | 1.3 | පර්යේෂණයේ අරමුණු | 15 |
| | | 1.3.1 ප්‍රධාන අරමුණ | 15 |
| | | 1.3.2 සෙසු අරමුණු | 15 |
| | 1.4 | පර්යේෂණ ක්‍රමවේදය | 15-16 |
| | | 1.4.1 මූලාශ්‍රය පරිශීලනය | 15 |
| | | 1.4.2 දත්ත හා තොරතුරු විශ්ලේෂණය | 16 |
| | 1.5 | පර්යේෂණයේ විෂය සීමා | 16 |
| | 1.6 | පරිච්ඡේද සංක්ෂිප්තය | 16 |
| 2. | දෙවන පරිච්ඡේදය - ආපදා නිවාරණය පිළිබඳ සමයාන්තර අදහස් | | 17-75 |
| | 2.1 | වෛදික ආගමික මතය | 20-35 |
| | 2.2 | අවෛදික ආගමික මතය | 35-54 |
| | | 2.2.1 අකිරියවාදය | 37-39 |
| | | 2.2.2 දෛවවාදය | 39-41 |
| | | 2.2.3 භෞතිකවාදය | 41-46 |
| | | 2.2.4 කිරියවාදය | 46-54 |

2.3 සෙමිටික් ආගමික මතය 54-75

2.3.1 යුදෙව් මතය 54-62

2.3.2 ක්‍රිස්තියානි මතය 62-68

2.3.3 ඉස්ලාමීය මතය 68-75

3. තෙවන පරිච්ඡේදය - ආපදා පිළිබඳ බෞද්ධ අදහස් 76-116

3.1 ආපදා පිළිබඳ බෞද්ධ අර්ථකථනය 76-82

3.2 න්‍යායාත්මක පසුබිම 83-88

3.3 ආපදා ඇතිවීමට බලපාන හේතු 88-116

3.3.1 මානසික හේතු 90-100

3.3.2 චර්යාත්මක හේතු 100-107

3.4.3 සමාජීය හේතු 107-111

3.3.4 ස්වභාවික හේතු 111-116

4. සිව්වන පරිච්ඡේදය - ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ අදහස් 116-172

4.1 න්‍යායාත්මක පසුබිම 117-120

4.2 ආපදා නිවාරණ ක්‍රමෝපායයන් 120-172

4.2.1 මානසික සංවර්ධනය 120-125

4.2.2 ආර්ථික සංවර්ධනය 126-132

4.2.3 පරිභෝජනය සහ සංරක්ෂණය 133-139

4.2.4 යහපාලනය 139-146

4.2.5 පරිසරහිතකාමිබව 146-154

4.2.6 අන්තර් පුද්ගල සම්බන්ධතාව 155-163

4.2.7 භෞත චිකිත්සා 164-169

4.2.8 ශාන්තිකර්ම 169-172

5. පස්වන පරිච්ඡේදය - සමාලෝචනය 173-179

6. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 180-189

# උපකාරානුස්මෘතිය

ජීවිතයේ පුංචි ම කාළයේ දී හිතුවක්කාරයෙන් පැවිදි වෙන්නට පන්සලට ආ පසු පිතෘ ස්නේහයෙන් හදාවඩාගත් ගුරුදේවෝත්තම, කළාගම් පළාතේ උපප්‍රධාන සංඝනායක අතිපූජ්‍ය කුඩාකත්නෝරුවේ සිද්ධත්ථ අපේ හාමුදුරුවන්ට, විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නා කාලයේ ගුරුවරයෙකු වූ ද පසු කලෙක තාවකාලිකව විශ්වවිද්‍යාලයේ කළ සේවයෙන් ඉවත්ව අරමුණක් නැතිව ගිය කල්හි පියෙකු මෙන් පිහිට වූ ද, මෙම ශාස්ත්‍රීය නිබන්ධය සඳහා උපදේශකත්වයෙන් මඟපෙන්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන, කෝට්ටේ කළ්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ කර්මවාගාචාර්ය අතිපූජ්‍ය ආචාර්ය මාගම්මන පඤ්ඤානන්ද අපේ හාමුදුරුවන්ට, විෂය දැනුමින් මා පෝෂණය කොට ශාස්ත්‍රීය ලෝකයේ ගවේෂණයන්ට මඟ පෙන්වූ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපති අතිපූජ්‍ය මහාචාර්ය නායිම්බල ධම්මදස්සි හාමුදුරුවන්ට, අහඹු ලෙස ජීවිතයේ අතර මග දී හමුවී සාංසාරික බැඳීම් නිසාවෙන් ම හැමදාමත් මාගේ හෙට දවස වෙනුවෙන් පියෙකු, ගුරුවරයෙකු, සහෝදරයෙකු, කළ්‍යාණ මිත්‍රයෙකු ලෙස කඳුළේ දී මෙන් ම සතුටේ දී ද නොවක් ව නොවෙනස් ව කැපවෙන දිරි දෙන භූගෝලවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය අතිපූජ්‍ය පින්නවල සංඝසුමන අපේ හාමුදුරුවන්ට, එමෙන් ම හැමදාමත් මාගේ හෙට දවස වෙනුවෙන් පියෙකු, ගුරුවරයෙකු, සහෝදරයෙකු, කළ්‍යාණ මිත්‍රයෙකු ලෙස ඉමහත් කරුණාවෙන් දිරි දෙන භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත, පූජ්‍ය මීපිටියේ සීලරතන පණ්ඩිත හාමුදුරුවන්ට, අහඹු ලෙස හමුවී නමුත් සුපුරුදු සාංසාරික සෙනෙහසින් අව්‍යාජ මනුෂ්‍යත්වයේ නාමයෙන් හෙට දවසක් වෙනුවෙන් දිරි දෙන කථිකාචාර්ය, රාජකීය පණ්ඩිත, ආචාර්ය පූජ්‍ය මැදගොඩ අභයතිස්ස හාමුදුරුවන්ට, මාගේ ගුරුවරයෙකු වූ, නිරන්තරයෙන් කළ්‍යාණ ගුණයෙන් මා හට ආශිර්වාද කරන, සතුටු වන, කථිකාචාර්ය පූජ්‍ය කුඹුකේ චන්ද්‍රාලෝක හාමුදුරුවන්ට, මාගේ ගුරුවරයෙකු වූ, යහමග පෙන්වා දෙන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය එළමල්දෙණියේ සාරානන්ද හාමුදුරුවන්ට, සොයුරු ස්නේහයෙන් මාගේ දියුණුව පතන, අනේක අයුරින් දිරි දෙන භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ ආරාධිත කථිකාචාර්ය පූජ්‍ය ශ්‍රාවස්තිපුර ශාන්ත සිරි හාමුදුරුවන්ට සහ මාගේ පැවිදි සහෝදර බක්මීගහඋල්පත අනුරුද්ධ, පානකාවේ පේමානන්ද, මඩාටුගම සුරක්ඛිත, තම්මන්නෑගම ආනන්ද ඇතුලු සියලු දෙනාට පාදාභිවන්දනයෙන් පින් දෙමි.

සංසාරගත සෙනෙහසින් මා මෙලොවට බිහිකොට තැනූ සදාදරණීය සෙනෙහෙබර පියාණන් වහන්සේට සහ පියාණන්ගේ වියෝවෙන් පසු ද අනේක බාධක මැඩගෙන අපව නෙත්සේ සුරකින ආශිර්වාද කරන සදාදරණීය අම්මාට පින් සිදු වේවා. මාගේ අවිනිශ්චිත ජීවිතය තාවකාලිකව නමුත් මරණයෙන් ගලවාගත් මා සදාරණීය කිරි අම්මාට, මව් මෙන් ම මට ආදරය කරන මගේ ම අක්කාට, ආදරණීය මල්ලීට සහ අයියාට, වැඩූ මව් සේ ම මට සෙනෙහෙ ඇති කමලා ආර්යවතී ජිනදාස මැණියන්ට පුණ්‍යානුමෝදනා කරන්නෙමි.

ශාස්ත්‍රීය මෙන් ම පෞද්ගලික වශයෙන් මාගේ ජීවිතයේ කාර්ය සාධනය වෙනුවෙන් ලෙන්ගතු දයාවෙන් කටයුතු කරන පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ හිටපු අංශාධිපති, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. ඒ. වීරසේන ඇදුරුතුමන්ට, මෙම පර්යේෂණය සඳහා මඟ පෙන් වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්. එම්. ධනපාල ඇදුරුතුමන්ට, අප අධ්‍යයනාංශයේ මහාචාර්ය ඥානදාස පෙරේරා ඇදුරු තුමන්ට, මනුෂ්‍යත්වයේ නාමයෙන් ලෙන්ගතු දයාවෙන් නිරන්තරයෙන් මා දිරි වඩන ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය පද්මසිරි කන්නංගර ඇදුරු තුමන්ට, ලෙන්ගතු දයාවෙන් අවවාද දෙමින් මාගේ දියුණුව පතන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්. එම්. යාපාරත්න ඇදුරු තුමන්ට, ශාස්ත්‍රීය කටයතු කෙරෙන් දායක කරගනිමින් දියුණුවට දිරිදෙන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගාමිණී රත්න ශ්‍රී ඇදුරු තුමන්ට, නොවක් සිතින් යහපත් හෙට දවසකට නිරන්තරයෙන් දිරි දෙන කථිකාචාර්ය අරුණ ශාන්ත වල්පොල ඇදුරු තුමන්ට ගුරු ගෞරවයෙන් හා කරුණාවෙන් පින් දෙමි. විශ්වවිද්‍යාලයේ දී හමුවී නමුත් ලෙන්ගතු දයාවෙන් මාගේ ජීවිතයට ආශිර්වාදයක් වූ අප විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර අනුර බමුණුසිංහ මහාත්මාණන්ට සහ පවුලේ සැමට, පශ්වාද් උපාධි පීඨයේ තුෂාර සහ මහේෂ් මහාත්මාවරුන්ට, පරිගණක අක්ෂර සංයෝජනය කළ සාමා පුෂ්ප කුමාරි මහත්මියට සහ නන් අයුරින් උපකාර කළ සැමට ද පින් දෙමි.

# ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ විග්‍රහය

පූජ්‍ය. කුඩාකත්නෝරුවේ විනීත හිමි

## සාරසංක්ෂේපය

ආපදා යන්න වර්තමාන ලෝකයෙහි වඩාත් අවධානයට ලක් වී ඇති ක්ෂේත්‍රයකි. ස්වභාවික ව මෙන් ම මිනිසාගේ මැදිහත් වීම හේතුවෙන් හට ගන්නා විවිධ ව්‍යසනයන් මානව සමාජය කෙරෙහි බලපෑමේ තීව්‍රතාව මත ඒවා කෙරෙහි ඇතිවන අවධානය දිනෙන් දින වැඩි වෙමින් පවතී. සමකාලීන ගෝලීය ගැටලු කෙරෙහි අවධානය යොමු කරන බොහෝ වියත්හු ආපදා සහ ඒවායින් සිදුවන බලපෑම අවම කිරීම පිළිබඳව ක්‍රමෝපායන් සෙවීමෙහිලා වඩාත් ප්‍රශස්ත ප්‍රවේශයක් හඳුනාගනු පිණිස සිය පර්යේෂණ මෙහෙයවති. එහෙත් ඒ බොහෝ පර්යේෂණ යොමු වී ඇත්තේ ආපදා සහ ඉන් හටගන්නා ප්‍රතිවිපාක පිළිබඳ ව භෞතිකවාදී යථාදර්ශයක් ඔස්සේ පිළියම් සෙවීම කෙරෙහි ය. පූර්ව සහ පශ්වාද් අවධීන් ඇතුලුව ආපදාව ගටගත් අවස්ථාවේ සිට අවසානය දක්වා ක්‍රියාත්මක විය යුතු විධික්‍රම වලින් සමන්විත වූ ආපදා කළමණාකරණ ක්‍රියාවලිය උක්ත ප්‍රවේශයන්හි කැපී පෙනෙන ලක්‍ෂණය වෙයි. එහෙත් ආපදාවල ස්වභාවය, ඒවා හටගැනීමට බලපාන හේතු මෙන් ම ඒවා නිවාරණය කළහැකි පිළිවෙත් පිළිබඳව ඇති සමයාන්තර අදහස් පිළිබඳව අවධානය යොමු වී ඇත්තේ අල්ප වශයෙනි. තත් සමයාන්තර අදහස් හා සසඳන කළ, හේතු ඵලවාදී න්‍යාය මත පිහිටා සත්ත්වයාගේ පැවැත්ම පිළිබඳව විග්‍රහ කරන බෞද්ධ දර්ශනය ආපදා සහ ඒවා නිවාරණය කළ හැකි මග පිළිබඳව ඉදිරිපත් කර ඇති විවරණය පර්යේෂකයන්ගේ අවධානයට යොමු වී නැති තරම් ය. එබැවින් ආපදා නිවාරණය පිළිබඳ බෞද්ධ විග්‍රහය විමර්ශනයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වෙයි. මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රය තුළ ප්‍රචලිත ව ඇති ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රගත තොරතුරු ඔස්සේ පර්යේෂණ අරමුණු කරා යාමේ ක්‍රමවේදය මෙහි භාවිතයට ගෙන තිබේ. මෙම පර්යේෂණය මගින් අනාවරණය කරගත් කරුණු අතර ආපදා සහ ඒවායේ බලපෑම පිළිබඳව ඉදිරිපත් වී ඇති සමයාන්තර මතවාද දෙවියන් වහන්සේ හෝ වෙනයම් අධිකාරයක් මත පදනම් වූවකි. එම සන්දර්භය තුළ හුදෙක් ආපදාව යන්න විග්‍රහ වන්නේ දේව ආඥාවට එරෙහිව යාම හේතුවෙන් ඇතිවන දඬුවමක් වශයෙන් බැවින් ආපදා

නිවාරණ පිළිවෙත වූයේ ද දෙවියන්ට අනුගතවීම පමණකි. බුදුදහම ආපදාව සහ ආපදාවට බලපාන හේතු මෙන් ම නිවාරණය ද අවධාරණය කරන්නේ හේතුඵලවාදී න්‍යාය මතයි. පංච නියාම ධර්ම අනුව හේතු කාරණා රාශියකින් ඵලයක් හටගනී. එය ස්වභාවය වශයෙනුත් මානව ක්‍රියාකාරීත්වයෙහි බලපෑමෙනුත් සිදුවේ. එහෙයින් ම එය සංකීර්ණ වූවකි. ආපදා නිවාරණයේ දී ද මූලහේතුව වශයෙන් එක ම අධිකාරයක් පිළිනොගන්නා බැවින් පුළුල් ක්ෂේත්‍රයක ආකල්පමය හා චර්යාමය සංවර්ධනයක් අවශ්‍ය වේ. මූලික වශයෙන් පුද්ගලයා හා ලෝකය පිළිබඳ ස්වභාවයත් එහි ක්‍රියාකාරීත්වයත් පිළිබඳව අවබෝධ කොටගත යුතුය. ඒ අනුව මැඳුම් පිළිවෙතක දේශපාලනික, ආර්ථික, සාමාජික සියලු ඇවතුම් පැවතුම් පදනම් විය යුතුය. එය ආයෝජන, පරිභෝජන හා සංරක්ෂණ විධි පරිසර හිතකාමී, පරහිතකාමී මෙන් ම ආත්මාභිලාශ මනාව තෘප්තිමත් කිරිමට ද ඉවහල්වේ. බුදුදහම ඒ වෙනුවෙන් ම ආපදා නිවාරණය සඳහා මග පෙන්වයි.

# පළමුවන පරිච්ඡේදය

# හැඳින්වීම

## 1.1 පර්යේෂණ පසුබිම

'ආපදා' (Disasters) යන්න නූතන ලෝකයේ සාකච්ඡාවට බඳුන් වන ප්‍රධාන මාතෘකාවකි. එය, මිනිසා ඇතුළු සියලු සත්ත්වයන්ගේ ජීවන පැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයකි. මිනිස් ජීවිතය හා බැඳී පවත්නා බොහෝ දෑ ආපදා නිවාරණය අරමුණු කොට පවතී. ජාති කුල ආගම් වශයෙන් මිනිසුන් අතර විවිධ වෙනස්කම් පැවතිය ද ආපදා නිවාරණය පිළිබඳ පොදු සාම්‍යයක් දක්නට ලැබේ. ලොව පහල වූ සියලු ආගම් හා දර්ශන මිනිසාගේ කායික මානසික සංවර්ධනය විෂයයෙහි බලපායි. විවිධ හේතු කාරක විසින් හටගන්නා ආපදා හා ආපදා නිවාරණය සම්බන්ධයෙන් ආගම් හා දර්ශනවල එන අදහස් ඒකමතික නොවේ. ආගම හෝ දර්ශනය විසින් ආපදා නිවාරණය වෙනුවෙන් පුද්ගලයින් විවිධ මානයන් කරා මෙහෙයවයි. උක්ත මාතෘකාව සම්බන්ධයෙන් බුදුදහම දරන ස්ථාවරය නූතන සමාජයේ පැවැත්ම කෙරෙහි බෙහෙවින් වැදගත් වේ.

සිංහල භාෂාවේ යෙදෙන 'ආපදා' යන්න සංස්කෘත හා පාලි භාෂාවන්හි තත්සම පදයකි. සංස්කෘත භාෂාවට අනුව ආපදා යනු ආ+√පද් හෝ √පත් ධාතුවෙන් සිද්ධ කෘදන්ත පදයකි. එහි වචනාර්ථය වන්නේ විපත, දුර්භාග්‍යය, දුර්දෛවය, අශුභය හෝ අකුශල යන්න යි[1]. 'ආපද්' යනු විපත බව ශබ්දස්තෝමමහානිධියෙහි දැක්වේ.[2] හිතෝපදේශ උපුටා දක්වන ශබ්දකල්පද්‍රෘමය ('ආපදර්ථෙ ධනං රක්‍ෂේත් - දාරාන් රක්‍ෂේත් ධනෛරපි.....') ආපදා යන්නට විපත හෝ හානිය යන අරුත් දෙයි.[3] සංස්කෘත-සිංහල ශබ්දකෝශය ද √පත් ධාතුවෙන් සිද්ධ ආපත්ති, ආපද් හා ආපදා යන ව්‍යවහාරයන් විපත, කරදරය හෝ අවාසනාව ලෙසින් අර්ථ දක්වයි[4]. සිංහල භාෂාවේ ආපදා යන්න පාලි භාෂාවේ ද ව්‍යසනය, විනාශය, විපත, විපත්තිය

---

1 **Sanskrit-English Dictionary,** Monior monior Williams, p142.
2 ශබ්දස්තොමමහානිධි, ශ්‍රී තාරානාථ තර්කවාචස්පති, 58 පිටුව.
3 ශබ්දකල්පද්‍රෘමයඃ (සංස්), රාධා කාන්ත දේව, ප්‍රථම කාණ්ඩය, 177-178 පිටු.
4 සංස්කෘත සිංහල ශබ්දකෝෂය, කදානේගෙදර ප්‍රඥාසානන්ද, 17පිට.

අදහස් කෙරෙන බව පාලි-සිංහල ශබ්දකෝෂය පවසයි[1]. උපද්දුතා යන පාලි රූපය උවදුරු හෝ උපද්‍රව අර්ථවත් කරන්නකි.[2] අභිධානප්පදීපිකා නිඝණ්ඩුව ව්‍යසන නාමය ආශාව, කෝපය හා ද්වේශය නිසා හටගන්නා විපත්ති වශයෙන් දක්වා තිබේ. එහි ම උපද්‍රව, ඊති, උපස්සග්ග, උපද්දව[3] යන පර්යාය පද ද දක්වේ. ගමන් කිරීමේ අර්ථ ඇති √ඉ ධාතුවෙන් උපන් 'ඊති' ශබ්දය ආපදා යන්න අරුත් ගන්වයි. මහාසද්දනීතියෙහි ද ඊති යනුවෙන් ආපදාවන් ම අදහස් කෙරෙන බව පෙන්වා දෙයි.[4]. එහෙත් ඇතැම් තැනක 'ඊති' යන්න ක්ලේශ, ස්කන්ධ හා අභිසංස්කාර යන අර්ථවල ද යෙදේ. [5]

'ආපදා' යන පාලි පදයට අර්ථ සපයන පාලි පොත් සමාගමේ ඉංග්‍රීසි ශබ්දකෝෂය (PTS Dictionary) accident (හදිසි කරදරය), misfortune (අවාසනාව), distress (ව්‍යසනය) යන අදහස් දක්වයි. calamity, misfortune, trouble යන පදවලින් ද ආපදා යන්න අදහස් කරයි[6]. ඒ අනුව සියලු සත්ත්වයන් කෙරෙහි පොදුවේ බලපාන කරදර, ව්‍යසන හෝ අභාග්‍ය සම්පන්න තත්ත්වය ම ආපදාව වශයෙන් පාලි භාෂාවේ අර්ථවත් වේ.

ආපදා යන්නට යෙදෙන ඉංග්‍රීසි 'Disaster' යන්න ලතින් භාෂාවේ ආභාසයෙන් සකස් වූවකි. ලතින් භාෂාවේ 'Des' යන්නෙන් සෑදුණු 'Dis' යන්නෙහි අර්ථය වෙන්වීම යන්න යි. 'Astrum' යන්නෙන් සෑදුණු 'Star' යනු තාරකාව යි. මෙයින් අර්ථවත් වන්නේ භාග්‍යයෙන් දුරස්වීම නිසා අභාග්‍ය සම්පන්න ලෙස මිනිසාට ඇතිවන විපත් ය[7]. Disaster, Calamity, Trouble, Misfortune යනාදිය ආපදා යන්නට පාලි මූලාශ්‍රයන්හි එන භාවිතයන් හා සමානාර්ථවත්ව යෙදේ[8]. භෞතික ආපදාවන් අරමුණු කොට ගත් ආපදා කළමනාකරණය යන නූතන විෂයධාරාව සඳහා ඉංග්‍රීසියේ Disaster යන්න යෙදේ. නමුත් ඉංග්‍රීසි-සිංහල

---

1 පාලි-සිංහල ශබ්දකෝෂය, මඩිතියවෙල සිරි සුමංගල හිමි, 113 පිටුව.
2 සරච්චන්ද්‍ර, විජිත නන්ද, ත්‍රිපිටක අර්ථ කෝෂය, 57පිටුව.
3 - එම -.
4 මහාසද්දනීතිය, (සංස්) අරුග්ගොඩ සීලානන්ද, 1909, 282 පිටුව.
5 සරච්චන්ද්‍ර, විජිත නන්ද, ත්‍රිපිටක අර්ථ කෝෂය, දෙහිවල, 2007, බෞ. සං. ම. 62පිටුව.
6 Davids, Ryze, **PTS Dictionary**, R. C. Childers, New Delhi, 1993, p.102.
7 http://wiki.answer.com/Q/what_is_disaster_managment
8 පාලිනිඝණ්ඩු-අභිධානප්පදීපිකා, මොග්ගල්ලානථෙර, 126 පිටුව.

ශබ්දකෝශයට අනුව Disaster, Calamity, Misfortune යන වචන සිංහල භාෂාවේ ආපදා, ව්‍යසන, විපත්, මහත් දුක්ඛදායක විනාශ, දුර්භාග්‍ය[1] යන අර්ථවල යෙදේ. එම සිංහල යෙදුම් අර්ථ ගන්වන ආපදා, ව්‍යසන, බ්‍යසන, විපත්, ඊති, ආපත්ති හා දුක්ඛ ආදි යෙදුම් තත්සම හෝ පර්යාය වශයෙන් දේශනා පාළියෙහි දක්නට ලැබේ.

'නිවාරණ' යන්න සංස්කෘත, පාලි හා සිංහල භාෂාවන්හි තත්සම පදයකි. සංස්කෘත භාෂාවේ නි + √වර = නිවාරණ යන්න වැළැක්වීම් අර්ථයෙහි යෙදේ.[2] පාලි භාෂාවේ ද 'වර' ආවරණෙ - වාරේති, වාරයති, නිවාරේති, නිවාරයති, නිවාරේතා යනුවෙන් විග්‍රහවෙන බව සද්දනීතිප්‍රකරණය දක්වයි. පාලි පොත් සමාගමේ පාලි-ඉංග්‍රීසි ශබ්දකෝශය අනුව නිවාරණ යන්න වළක්වා ගැනීම (Warding off), මැඩපැවැත්වීම (Keeping back), නිවාරණය (Preventing), ප්‍රතික්ෂේප කිරීම (Refusal) යන අර්ථයන්හි යෙදේ.[3] එමෙන් ම පාලි-ඉංග්‍රීසි ශබ්දකෝශය[4] (Pali-English Dictionary) ද එම අර්ථ දක්වයි. සංස්කෘත-සිංහල ශබ්දකෝශය[5] නිවාරණ = දුරලීම, වැලකීම, තහනම, වැළැක්වීම වශයෙන් අරුත් ගන්වන අතර ඒ සඳහා සිංහලාර්ථ සපයන ශ්‍රී සුමංගල ශබ්දකෝශය[6] ද වැළැක්වීම යන අරුත් සපයයි. නිරුක්ති සහිත සිංහල ශබ්ද කෝෂය[7] සංස්කෘත මූලයක් ඇති නිවාරණ යනු 'උපද්‍රව දුරු කිරීම වැළැක්වීම, හෝ සන්සිඳවීම' බව දක්වයි. මේ අනුව නිවාරණ යන්න වැලැක්වීම් අර්ථයෙහි සංස්කෘත, පාලි හා සිංහල භාෂාවන්හි සමානාර්ථවත්ව යෙදෙන බව පැහැදිලි ය. බෞද්ධ මූලාශ්‍රයන් ද එම අර්ථයෙන් තත්භව හා තත්සම ලෙස යොදාගෙන තිබේ.

### 1.1.1 ආපදා නිවාරණයේ ඓතිහාසික පසුබිම

මානවයාගේ සම්භවය කවදා කෙසේ සිදුවී ද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැක. ඒ පිළිබඳ ඉතිහාසඥයන්, මානව විද්‍යාඥයන් මෙන් ම සමාජ විද්‍යාඥයන් ද විවිධ පර්යේෂණ සිදු

1 මලලසේකර ඉංග්‍රීසි-සිංහල ශබ්දකෝෂය, 157-309 පිටු.
2 **Sanskrit-English Dictionary**, Monnir monnir Williams, 559p
3 **PTS Dictionary**, 372p.
4 **Pal-English Dictionary**, A. P. Buddhadatta Thero, 146p.
5 සංස්කෘත-සිංහල ශබ්දකෝෂය, කදාතේගෙදර පුවතිසි අලගියවන්න, 429 පිටුව,
6 ශ්‍රී සුමඞ්ගල ශබ්දකෝෂය, 471 පිටුව.
7 නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, සිරි ගුණසිංහ, 614 පිටුව.